www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව තුල විවෘත යුද්ධය පුපුරා යයි

## Open warfare erupts in Sri Lanka

**කේ. රත්නායක විසිනි**
**2006 අප්‍රේල් 27**

ශ්‍රී ලංකාවේ උතුරේ හා නැගෙනහිර එලිපිට නොවූ අප්‍රකාශිත යුද්ධයේ ප්‍රචන්ඩත්වය සති කීපයක් පුරා උත්සන්න වීමෙන් අනතුරුව කොලඹ ආන්ඩුව සහ දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) විවෘත එදිරිවාදිකම්වල මාවතට පිලිපන්ව සිටී. ආසන්න හේතුව වූයේ කොලඹ මධ්‍යයේ පිහිටි යුද හමුදා මූලස්ථානයේ සිදු වූ මනා ලෙස සැලසුම් කල මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් වුවද මෙම ගැටුමට සෘජුව ම වගකිව යුතු වන්නේ අර්ථාන්විත සාකච්ඡාවකට එලඹීම වසර තුනකටත් වැඩි කලක් තිස්සේ ප්‍රතික්ෂේප කල එකකට එකක් පසු ආ ශ්‍රී ලංකාවේ ආන්ඩු ය.

අඟහරුවාදා සිදු වූ ප්‍රහාරයට සම්බන්ධ වූයේ දැඩි ලෙස රැකවල් ලූ අධි ආරක්ෂිත කලාපය අසල හමුදා රෝහලට පැමිනෙන බව ඇඟවූ, ගර්භනී කාන්තාවක ලෙස සැරසුනු මරාගෙන මැරෙන බෝම්බ කාරියක වේ. හමුදා ප්‍රධානී ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා පැමිනෙන තුරු බලා සිටි ඇය, වැඩි වශයෙන් මිලිටරි නිලධාරීන් ඇතුලත් අට දෙනෙකු එතැනම මරා දමමින් ද තවත් 27 දෙනෙකුට තුවාල සිදු කරමින් ද බෝම්බය පුපුරවා හැරියා ය.

තමන් සම්බන්ධ නැතැයි නිල වශයෙන් ප්‍රකාශ කල ද ප්‍රහාරය සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම සිදු කලේ එල්ටීටීඊය බවට සැකයක් නැති තරම් ය. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ටීටීඊයේ ලාංඡනය යි. බොහෝ සේම විය හැකි දෙය වන්නේ එල්ටීටීඊයට එරෙහි දැඩි පියවර ගැනීම සඳහා ප්‍රසිද්ධියේ උද්ඝෝෂනය කිරීම හේතුවෙන් ෆොන්සේකාව ඉලක්ක කර ගත් බව ය. ඔහු බරපතල තුවාල ලැබුව ද පිපිරුමෙන් දිවි ගලවා ගත්තේ ය. රටේ අගනුවර මිලිටරි මූලස්ථානයට පහර එල්ල කිරීම සැලසුම් කැරුනේ මිලිටරියේ හෝ ආන්ඩුවේ කිසිවකුත් ආරක්ෂිත නැතැයි යන පනිවිඩය දීම සඳහා ය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ මිලිටරිය නැගෙනහිර ත්‍රිකුනාමල නගරාසන්නයේ සාම්පූර් ප්‍රදේශයේ එල්ටීටීඊ කඳවුරුවලට ගුවන් හා කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීමේ නිමිත්තක් ලෙස බෝම්බ ප්‍රහාරය වහාම ඩැහැ ගත්තේ ය. ආසන්න බද මුතූර්හි තවත් ගැටුමක් ඇතිවිය. ප්‍රහාරයන් බොහෝ කලකට පෙර සැලසුම් කල ඒවා බවට කිසිදු සැකයක් නැත. ත්‍රිකුනාමලේ තීරනාත්මකව මූලෝපායික යුද හා නාවික කඳවුරුවලට ආසන්නව එල්ටීටීඊය ගැවසීම දිගු කලක සිට ම මිලිටරි මූලාශ්‍රමය කොලඹ පුවත්පත්වල විවේචනයේ මාතෘකාවක් විය.

එල්ටීටීඊ ප්‍රකාශකයන්ට අනුව සාම්පූර් ප්‍රදේශයේ ගුවන් ප්‍රහාරවලින් නිවාස බිමට සමතලා වූ අතර සිවිල් වැසියන් ද ඇතුලුව අඩු තරමේ 12 දෙනෙකු වත් මිය ගොස් තිබේ. මුතූර් සහ සාම්පූර් ප්‍රදේශවලින් පලා යන සරනාගතයින්ගේ තක්සේරුගත සංඛ්‍යාව 15,000 සිට 40,000 දක්වා විචලනය වේ. එල්ටීටීඊ මෝටාර් ප්‍රහාරවලින් මුස්ලිම්වරු තිදෙනෙක් මිය ගියේ යැයි පවසමින් මුතූර් ප්‍රහාරය සම්බන්ධයෙන් මිලිටරිය එල්ටීටීඊයට දෝෂාරෝපනය කරයි. උතුරු යාපන අර්ධද්වීපයේ මිලිටරිය -- හා එල්ටීටීඊය -- පාලනය කරන ප්‍රදේශ හරහා දිවෙන '9 ප්‍රධාන මාර්ගය වසා දැමුනි.

තමන් සාමය සඳහා පෙනී සිටින බව කියා පාන ආන්ඩුව හා එල්ටීටීඊය යන දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් වත් නිල වසයෙන් සටන් විරාමයෙන් ඉවත් වී නැත. එහෙත් සියලු සලකුනු පෙන්නුම් කැරෙන්නේ සිංහල දෙමල මුස්ලිම් යන දිවයිනේ කම්කරු ජනයාට එක ලෙස විනාශකාරී වන්නා වූ ප්‍රතිඵල ගෙන එනු ඇති සම්පූර්න සිවිල් යුද්ධයක් දෙසට වේගයෙන් ලිස්සා යාම ය. 2002ට පෙර සිදුවූ දශක දෙකක බිහිසුනු ගැටුමේ දී 65,000කට වැඩි පිරිසක් මිය ගියහ. මීට බෝහෝ වැඩි පිරිසක් ආබාධිත තත්වයට පත් විය නැත හොත් සරනාගත විය.

දෙපාර්ශ්වයම යුද්ධයේ තර්ජනාංගුලිය ඔසවයිඃ එල්ටීටීඊ ප්‍රකාශක එස්. පුලිදේවන් මාධ්‍ය අමතා මෙසේ ප්‍රකාශ කලේ යඃ "ඔවුහු කාලතුවක්කු උන්ඩවලින් වෙඩි තබති. ත්‍රිකුනාමලයේ යුද තත්වයක් තිබෙනවා වැනි ය. ප්‍රහාරයන් දිගටම සිදු වුන හොත් එල්ටීටීඊයට මිලිටරි ආරක්ෂිත ක්‍රියාවන්ට යාමට බල කැරෙන්නේ ය." ත්‍රිකුනාමලයේ එල්ටීටීඊ නායක එස්. එස්. එලිලන් මෙසේ අනතුරු ඇඟවී යඃ "අපි සීරුවෙන් සිටින අතර සතුරාට අති විනාශකාරී ලෙස හානි සිදුවන හා විපත් ගෙන දෙන බලයකින් ප්‍රතිචාර දැක්වීමට අපගේ නායකත්වයෙන් උපදෙස් ලැබෙන තුරු බලා සිටිමු."

ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල රනකාමීත්වයේ අඩුවක් නැතිව ප්‍රකාශ කරමින්: "ආරක්ෂක කාරනාවල දී බලා සිටීමක් හෝ සීමාවක් නැත. එල්ටීටීඊය සිය ප්‍රහාර දිගටම ගෙන ගිය හොත් සැලසුම් සහගත ප්‍රතිප්‍රහාරයන් සිදු වනු ඇත. එල්ටීටීඊය ආරක්ෂක හමුදා ඉලක්ක කරනා තුරාවටම මෙය සිදු වනු ඇත." ශ්‍රී ලංකාවේ මිලිටරිය විසින් පලමු වරට කරන ලද විවෘත උල්ලංඝනයන්ගෙන් අනතුරුව සටන් විරාමය ඉරීගොස් ඇතැයි යන්න මාධ්‍ය ඇමති අනුර ප්‍රියදර්ශන යාපා ප්‍රකාශ කලේ "එය ටිකක් දුර්වලව තිබෙනවා" පමනක් යැයි කියමිනි.

ශ්‍රී ලංකා නිරීක්ෂන දූත මෙහෙයේ (එස්එල්එම්එම්) ප්‍රධානී මේජර් ජනරාල් උල්ෆ් හෙන්රික්සන් අනතුරු ඇඟවූයේ ගුවන් ප්‍රහාර දිගට ම පැවතුන හොත් සාම කථා දුෂ්කර වන බවට ය. යලි යුද්ධයට පිවිසීම අන්තිම අයහපත් දෙය බව පැවසූ ඔහු, "ඒ සඳහා දෙගොල්ලන් ම සූදානම් නැතැයි මම සිතමි. එසේ ම ඔවුන් එසේ කල හොත් එය ශ්‍රී ලංකාවේ ජනතාවට සහ ඔවුන්ගේ ම මිලිටරි ශක්තීන්ට බරපතල විනාශයක් ගෙන දෙනවා ඇත" යනුවෙන් තව දුරටත් පැවසී ය. කෙසේ වෙතත් ප්‍රධාන විදේශ බලයන් විසින් අනුග්‍රහය දක්වූ ඊනියා සාම ක්‍රියාවලිය ඇන හිට තිබේ. තුන් අවුරුද්දක තරම් කාලයකට පසුව පෙබරවාරියේදී ජිනිවාවල දී සාකච්ඡා ඇරඹුන නමුත් රාජපක්ෂ ආන්ඩුව පවත්නා සටන් විරාමයේ ප්‍රධාන සංශෝධනයක් කල යුතුයි පැවසීම නිසා බිඳ වැටීමේ මුව විටටම පැමිනියේ ය. අවසන සටන් විරාමයට කැපවීමට හා එය ක්‍රියාත්මක කිරීමට දෙපාර්ශ්වයම පොරොන්දු වූ නමුත් නැගෙනහිර හා උතුරේ සැඟවී කරන අරගලය දිගට ම පැවතුනි.

අප්‍රේල් 19-21 පැවැත්වීමට නියමිතව තිබූ දෙවන වටයේ සාකච්ඡා අප්‍රේල් 24-25ට යලි සැලසුම් කර අනතුරුව මුලුමනින් ම අවලංගු කර දමන ලදී. ආරම්භක නොඑකඟතාවය වූයේ නැගෙනහිර ප්‍රදේශයේ එල්ටීටීඊ අන දෙන නිලධාරීන් උතුරේ වන්නි එල්ටීටීඊ මූලස්ථානය වෙත ප්‍රවාහනය කිරීමේ දී පෙර දී කල ආකාරයට මිලිටරි හෙලිකොප්ටරයක් සැපයීම ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම ය. පසුව එල්ටීටීඊය සාකච්ඡාවලින් ඉවත් වූයේ දෙමල අර්ධ මිලිටරි සංවිධාන නිරායුධ කිරීමට සහ නැගෙනහිර සිය සාමාජිකයන්ට දිගින් දිගට ම එල්ලවන ප්‍රහාර අවසන් කිරීමට ආන්ඩුව අපොහොසත් වීම පෙන්නුම් කරමින් ය.

එල්ටීටීඊය වෙත එල්ල කරන ලද ප්‍රහාරයන්ගෙන් හුදු සිව් පැයකින් පසුව අඟහරුවාදා රාත්‍රියේ ජනාධිපති රාජපක්ෂ ජාතිය අමතා කල රූපවාහිනී කථාවක් විසුරුවා හලේ ය. ඔහු "ඉවසීම හා හික්මීම" වෙනුවෙන් මිලිටරිය වර්නනා කල අතර එල්ටීටීඊයට විරුද්ධව සහාය ඉල්ලා ප්‍රධාන බලවතුන්ට ආයාචනය කලේ ය. "සාකච්ඡා කර මතභේද නිරාකරනය කර ගැනීමේ අපේ ආයාචනාවලට එල්ටීටීඊයේ ප්‍රතිචාරය වන්නේ මරාගෙන මැරෙන බෝම්බ යොදා ගැනීම බව අද ජාත්‍යන්තර ප්‍රජාවට විපුල ලෙසින් පැහැදිලි ය", යනුවෙන් ඔහු ප්‍රකාශ කලේ ය.

ඔහු ගේ ප්‍රකාශයන් අතිශයින් ම කුහක ය. පසු ගිය නොවැම්බරයේ දී රාජපක්ෂ ජනාධිපතිවරනය යන්තමින් ජය ගනිමින් සිංහල අන්තවාදී පක්ෂ දෙකක් සමග --ජනතාවිමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය (ජාහෙඋ) -- ආකාරගත මැතිවරන එකඟතාවලට අත්සන් තැබීමෙන් අනතුරුව ය. මෙම ගනුදෙනුවට විධිවිධාන මාලාවක් අන්තර්ගත වූ අතර ඊට එල්ටීටීඊයට අවසන් නිවේදනයක් නිකුත් කිරීමේ මට්ටමේ වන සටන් විරාමය සම්පූර්නයෙන් ම ප්‍රතිශෝධනය කිරීම ද ඇතුලත් විය.

රාජපක්ෂ තමන් "සාමයේ මිනිසකු" ලෙස ප්‍රකාශ කරන අතරවාරයේ ම මිලිටරිය, දෙමල සුලුතරය මත මර්දනකාරී ආරක්ෂක විධිවිධාන පනවා, එල්ටීටීඊ කේඩර හා හිතවතුන් මත ප්‍රහාරයන් මාලාවකට දෙමල අර්ධ මිලිටරි කන්ඩායම්වලට රහසේ ආධාර කලේ ය. ජිනිවා කතාබහවල පලමු වටය තුලදී ප්‍රචන්ඩ ක්‍රියාවල සමපාතී වීමක් තිබුන නමුත් අප්‍රේල් 27 වන දා එල්ටීටීඊ හිතවාදී දේශපාලනඥයකු වන වී. විග්නේශ්වරන් ඝාතනය කිරීමෙන් අනතුරුව ප්‍රහාර සහ ප්‍රතිප්‍රහාර නාටකාකාරව උත්සන්න විය. පසු ගිය දෙසතිය තුල දී ඉහල ගිය ප්‍රචන්ඩත්වයේ වටයක දී මිලිටරි නිලධාරින්, එල්ටීටීඊ සාමාජිකයින් හා සිවිල් වැසියන් ඇතුලු 100කට වැඩි පිරිසක් මිය ගියහ.

පෙබරවාරියේ ජිනිවා සාකච්ඡා පැවැත්වූ තැන සිට ම රාජපක්ෂ එල්ටීටීඊයට එරෙහිව වඩා ආක්‍රමනශීලී පිලිවෙතක් ගත යුතු යැයි ඔහුගේ ස්වොත්තමවාදී සගයින්ගෙන් වූ වැඩෙන පීඩනයක් යටතේ සිටියේ ය. ඔහුගේ සුලුතර ආන්ඩුව පාර්ලිමේන්තුව තුල ජවිපෙ හා ජාහෙඋ මත රඳා පවතී. දෙවන වටයේ සාකච්ඡාවලට පෙර සමයේ දී ජවිපෙ නායකත්වය යලිත් වතාවක් සටන් විරාම ගිවිසුම වෙනස් කිරීමට රාජපක්ෂ පෙරට යා යුතු යැයි  බල කරමින් සිටියේ ය.

ජවිපෙ අඟහරුවාදා ප්‍රහාරය යුද ප්‍රකාශ කිරීමක් ලෙස හංවඩු ගැසූ අතර සටන් විරාමයෙන් මුලුමනින් ම ඉවත්වන ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. ඊයේ ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මෙසේ ප්‍රකාශ කලේ යඃ "සටන් විරාම ගිවිසුම මිය ගොස් ය. කොන්දේසි සහ නිගමන තව දුරටත් වලංගු නොවන අතර ආන්ඩුව තව දුරටත් ඒ පිලිබඳව කලබල විය යුතු නැත. ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායම් නායක විමල් වීරවංස "ත්‍රස්තවාදයට එරෙහිව මව්බිම ආරක්ෂා කිරීමට" සියලු ම පක්ෂ රාජපක්ෂ වටා එක්සත් වන ලෙස කියා සිටියේ ය.

මහා ව්‍යාපාරිකයන් වෙනුවෙන් යුද්ධයට සාකච්ඡාමය නිමාවක් සඳහා පෙරට ගිය විපක්ෂයේ එක්සත් ජාතික පක්ෂය (එජාප) වැද දැඩි පිළිවෙතක් ගත යුතු ය යන පීඩනය එල්ලව තිබේ. රාජපක්ෂ මුනගැසීමෙන් අනතුරුව එජාප නියෝජ්‍ය මහ ලේකම් තිස්ස අත්තනායක මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය හෙළා දුටු අතර මෙසේ අනතුරු ඇඟවී යː "සාම ක්‍රියාදාමයේ ප්‍රතිඵල ලැබීමට නම් එල්ටීටීඊය තමන්ගේ ප්‍රචන්ඩ ක්‍රියා පාලනය කර ගැනීමට ඉක්මන් ක්‍රියා මාර්ග ගත යුතු ය." පෙර කල දී එජාපය වර්ගවාදී ආතතීන් ඇවිලවීම පිළිබඳව ජවිපෙට හා ජාහෙඋට දොස් පැවරී ය.

කොළඹ මාධ්‍යද රාජපක්ෂ සේ ම සාමය පිළිබඳව වියුක්තව කථා කරන නමුත් පැහැදිලිව ම යුද්ධය සඳහා සූදානම් වෙති. දක්ෂිනාංශික අයිලන්ඩ් පුවත්පතේ කතුවැකියක් ඊයේ මෙසේ ප්‍රකාශ කලේ යː "එල්ටීටීඊය මුලුමනින් ම සිඳ දැමීමට ඉදිරිපත්ව සිටින ජිනිවා සාකච්ඡා පිළිබඳ බලාපොරොත්තු ඊයේ ප්‍රහාරයෙන් වනසා දැමුනි. යුද්ධය දැනට මත් අරඹා ඇතැයි පෙන්නුම් කෙරෙන මෙවැනි ත්‍රස්ත ක්‍රියාවන් එල්ටීටීඊය විසින් සිදු කරද්දී සටන් විරාමය තව දුරටත් පවතින්නේ ද කියා කල්පනා කර බලනු වටී. මෙය පරිස්සම් සහගතව බෝම්බ මගඅරිමින් සාම මාවතේ පිය නගමින් අවසන පැමිනෙන ඕනෑම දෙයකට සූදානම් වීම සඳහා ආන්ඩුවට කෙරෙන වගකීම පැවරීමකි." සාමාන්‍යයෙන් සාම සාකච්ඡාවලට සහාය පලකරන *ඩේලිමිරර්* පුවත්පත අද "නිදහස හෝ ජීවිත පිළිබඳව සැලකිල්ලක් නැති දරුනු ත්‍රස්තවාදීන්ට" එරෙහිව එක්සත් බව ඉල්ලමින් කතු වැකියක් පල කලේ ය. "කෙසේ වෙතත් සාකච්ඡා සඳහා දොරගුලු විවෘතව ඇතිතාක් දුරට රට විනාශකාරී යුද්ධයක අගාධයට වැටීමට අවකාශ නොදෙමින් වගකීමකින් යුක්තව ක්‍රියා කිරීමට ආන්ඩුව බැඳී තිබේ" යයි පවසමින් එල්ටීටීඊයට විරුද්ධව එකට එක කිරීමේ කටයුතු සඳහා වන ඉල්ලීම්වලට අවනත නොවන ලෙස පුවත්පත රාජපක්ෂගෙන් අඩමානව ඉල්ලා සිටියේ ය. ඇමරිකාව සහ අනෙකුත් ප්‍රධාන බලවත්හු ඉන්දු උප මහාද්වීපයේ අස්ථාවර කාරකයක් වන ගැටුම අවසන් කිරීමේ මාර්ගයක් ලෙස සාම ක්‍රියාවලියට සහාය දුන්හ. කෙසේ වෙතත් ඔවුන්ගෙන් කවරෙකු හෝ ශ්‍රී ලංකාවේ ජනතාව මත යුද්ධයෙන් ඇති කරනු ලැබ තිබෙන වදවේදනා පිළිබඳව සැලකිලිමත් නැත. විශේෂයෙන් ම වොෂිංටනය, වැඩිවැඩියෙන් වැදගත්වෙමින් පවත්නා කලාපයේ, ඇමරිකානු මූලෝපායික සහ ආර්ථික උවමනාවන් පෙරට දැමීමේ මාර්ගයක් ලෙස ඉන්දියාව සමග වඩා සමීප සබඳතා ගොඩ නගමින් සිටී.

ඇමරිකාව, යුරෝපා සංගමය, ජපානය සහ ඉන්දියාව යන සියල්ලන් ම මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය හෙළා දක ඇති අතර සටන් විරාමයට කැපවීම සහ සාකච්ඡාවලට යලි පැමිනීම සඳහා දෙපාර්ශ්වයෙන් ම ඉල්ලා තිබේ. බදාදා ඉන්දියානු ආන්ඩුව නව දිල්ලියේ දී තත්වය තක්සේරු කිරීම පිනිස අර්බුද කලමනාකරන කන්ඩායම කැඳවූ අතර ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පෝක් සමුද්‍ර සන්ධිය වෙතට අතිරේක යුද නැව් පිටත්කර හැරියේ ය.

කෙසේ වෙතත් වොෂිංටනයේ අවධාරනයේ වෙනසක් සිදුව තිබේ. දකුනු ආසියාව පිළිබඳව ඇමරිකානු උප රාජ්‍ය ලේකම් රිචඩ් බව්චර් මෙසේ සඳහන් කලේ යː "සාම ක්‍රියාවලිය යලි අරඹනවා වෙනුවට දෙමල කොටි යුද්ධය යලි ඇරඹීමට තීරනය කිරීම කනගාටු දායක ය. මෙම ක්‍රියාදාමය නවතා ලීමට දෙමල කොටින් මත අපට හැකිතරම් පීඩනය යෙදවීම සඳහා සහ මෙම තර්ජනයට මුහුන දීමේ දී ආන්ඩුවට සහාය දීමට ඇති මාවත් විමසා බැලීමට ලොව වටා ආන්ඩු සමග සබඳතා පවත්වමින් සිටිමු."

බවුචර්ගේ සඳහන් කිරීම්වලදී යුද්ධය පිළිබඳව සියලු ම දෝෂාරෝපනය එල්ටීටීඊය මත පටවයි. කැපී පෙනෙන ලෙස ඔහු සාකච්ඡා මේසයට යලි පැමිනෙන ලෙස ඉල්ලා සිටිනවා. පමනක් නොව, "තර්ජනයට මුහුන දීමේ දී" කොළඹ ආන්ඩුවට ජාත්‍යන්තර සහයෝගය ද කැඳවයි. ජනවාරියේ දී ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති ජෙෆ්රි ලුන්ස්ටඩ් යුද්ධය ඇවිලී යාමක් සිදුවුව හොත් එල්ටීටීඊයට "වඩා ශක්තිමත් වැඩි හැකියාවකින් යුතු, වඩා අධිශ්ඨානශීලී ශ්‍රී ලංකා මිලිටරියකට" මුහුන දෙන්න වනු ඇතැයි එල්ටීටීඊයට තර්ජනය කරමින් වඩාත් නිශ්චිතව මේ බව පැවසී ය.

විවෘත යුද්ධය දෙසට ලිස්සා යාම සිංහල දෙමල මුස්ලිම් සහ ශ්‍රී ලංකා ධනේශ්වරයේ සියලු ම කොටස්වලට එරෙහි නින්දා සහගත අධිචෝදනාවකි. ඕනෑම යුද්ධයක මිල දරා ගැනීමට අනිවාර්යයෙන් බල කැරෙනු ඇති දිවයිනේ ජනගහනයෙන් අතිමහත් වැඩි දෙනාට යුද්ධය අවශ්‍ය නැත. එහෙත්, මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා යහපත් ජීවන තත්වයන් උදෙසා කම්කරු ජනයාට පවතින ප්‍රාර්ථනාවන් ඉටු කරලීමේ ලා මුලුමනින් ම අපොහොසත් බවට ඔප්පුකර පෙන්වා ඇති පාලක පන්තිය කාලයෙන් කාලයට කම්කරු පන්තිය භේද කිරීමටත් ශ්‍රී ලංකා රාජ්‍යයට මුක්කු ගසා පවත්වා ගෙන යාමටත් වාර්ගික ආතතීන් අවුලුවාලීමේ මගට පිළිපන්නේ ය.

උතුරේ සහ නැගෙනහිරට උත්සන්න වන ගැටුම් සමග කම්කරුවන්, ගොවීන් සහ දුගීන් විසින් ආන්ඩුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධානයන් අනුයන කර්කෂ සැලසුම්වලට හා වෙලඳපොල ප්‍රතිසංස්කරනවලට එරෙහි වර්ජන හා විරෝධතා එකට සම්පාතවීම අහම්බයක් නොවේ. රාජ්‍ය අංශයේ ලක්ෂ ගනන් කම්කරුවෝ වේගයෙන් ඉහල යන මිල ගනන් හා එක්ව යන ලෙස වැටුප් ඉහල දැමීමේ ඉල්ලීම වටා වූ

ප්‍රධාන එක් දින විරෝධතා දෙකකට සහභාගී වූහ. තමන් ඉන්ධන සහනය කපා දමන බවටත් වී ගොවීන් හැර අන් සියලු ග්‍රාමීය අංශවල පොහොර සහනාධාරය ඉවත් කරන බවටත් මුදල් හිරවීමකට ලක්ව සිටින රාජපක්ෂ ආන්ඩුව නිවේදනය කලේ පසු ගිය සතියේ ය.

එල්ටීටීඊය සම්බන්ධයෙන් ගත් කල එය ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම යොදා හිතුමතයේ බදු පැනවීම පිලිබඳව දෙමල සුලුතර ජනයාගේ වැඩෙන වෛරයට මුහුන දී සිටී. සටන් විරාමය අත්සන් කර සිව් වසරකට පසුව ද ලක්ෂ ගනන් ජනයා තව මත් සරනාගත කඳවුරුවල ජීවත් වෙති. බොහෝ දෙමල ජනයාට සිය ජීවන තත්වයන්ගේ කැපී පෙනෙන වර්ධනයක් ලැබී නැත. ගැටලුව ප්‍රගතිශීලීව විසඳීමට කිසිදු ඉදිරි දර්ශනයක් නොමැති එල්ටීටීඊය සිය කොලඹ සිංහල ප්‍රතිමල්ලවයන් සේ ම තම දේශපාලන අර්බුදය විසඳා ගැනීමේ එකම මාවත ලෙස යුද්ධය සැලකීමට හොඳින් ම ඉඩකඩ තිබේ.

© www.wsws.org